

ලෝක වනජීවී දිනය අදයි

# රක්ෂිතවල තණකොළවලින් කිරි එරෙයිද?

අද (03ද) ලෝක වනජීවී දිනයයි. එකී දිනය සමරන අද දිනයේ අප මේ කියන්න යන කතාව එතරම් සුබදායී එකක් නොවේ. වනජීවී සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු යටතේ පාලනය වන වනාන්තරවලට ගවයන් ඇතුළු කිරීම සඳහා යෝජනාවක් ඉකුත් පෙබරවාරි මස 24 වැනිදා පාර්ලිමේන්තුවේදී කතා බහට ලක් විය. කිරි නිෂ්පාදනය වැඩි කිරීම අරමුණු කරගෙන වනාන්තර තුළට ගවයන් ඇතුළු කිරීමට තිබෙන නීතිමය බාධා ඉවත් කිරීම මෙම යෝජනාවේ මූලික අරමුණ විය. වනජීවී හා වන සංරක්ෂණ කැබිනට් ඇමැති ධුරය හොබවන සී.බී. රත්නායක විසින් මෙම යෝජනාව පිළිගෙන ඇත. මෙම යෝජනාව අද වෙද්දී පරිසරවේදීන් අතර මහත් ආන්දෝලනයකට තුඩු දී තිබෙන මාතෘකාවක් බවට පත්ව ඇත. ඊට හේතුව වී ඇත්තේ අභයභූමි තුළට ගවයන් ඇතුළු කිරීමට ඉඩ ලබාදීම නිසා ඇතිවන පාරිසරික ගැටලුව සුළු පටු නොවන බැවිනි. එය මෙරට සංචාරක කර්මාන්තයේ කඩා වැටීමකටද තදින් බලපාන කාරණයක් බව පරිසරවේදීහු පවසති.

පොලොන්නරුව, ජල ගැලුම් නිම්න ජාතික වනෝද්‍යානයට ගවයන් ඇතුළු කිරීමට අවසරය ලබාදෙන ලෙස ඉල්ලා වනජීවී රාජ්‍ය ඇමැති විමලවීර දිසානායක වනජීවී නිලධාරීන් සමග ඉකුත් 2020 වසරේ නොවැම්බර් මස අගදී ගැටුම් තත්ත්වයක්ද ඇතිකර ගත්තේය. මෙහිදී ඇමැතිවරයා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අඩවි ආරක්ෂකවරුන් දෙදෙනකුට බැණ වැදුණු අතර, මේ නිසා වනජීවී නිලධාරීන් දෙදෙනාට ස්ථාන මාරු ලබාදීමට පවා රාජ්‍ය ඇමැතිවරයා කටයුතු කළේය.

කෙසේ වෙතත්, අභයභූමි කලාපවලට ගවයන් ඇතුළු කිරීම යළි කරළියට පැමිණ තිබේ. වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය විසින් ඉදිරි දිනවලදී වනාන්තරවලට ගවයන් ඇතුළු කළ හැකි පරිදි වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනතද සංශෝධනය කිරීමට නියමිත බව එම අමාත්‍යාංශයේ ආරංචි මාර්ග සඳහන් කරයි.

වනාන්තර තුළට ගවයන් ඇතුළු කිරීම නිසා වනාන්තර පද්ධතියට සිදුවන හානි තත්ත්වයන් හඳුනාගෙන වන සංරක්ෂණ ආඥා පනත මගින් රක්ෂිත වනාන්තර තුළට ගවයන් ඇතුළු කිරීම තහනම් කරනු ලැබුවේ 1907 වසරේ සිටය. වනසත්ව හා වෘක්ෂලතා ආඥා පනතට අනුවද රක්ෂිත තුළට ගවයන් ඇතුළු කිරීම තහනම්ය. එලෙස ගවයන් ඇතුළු කළහොත් රුපියල් ලක්ෂ දෙකක් දක්වා දඩයක් නියම කළ හැකිය. මෙලෙසින් නීති සකසා ඇත්තේ ගවයන් වනාන්තර තුළට ඇතුළු කිරීම නිසා ඇතිවන පාරිසරික සහ සාමාජීය බලපෑම් පිළිබඳව මනාව අධ්‍යයනය කිරීමෙන් අනතුරුවය.

වනසංරක්ෂණ ආඥා පනතේ 6 (2) (ඈ) වගන්තිය යටතේ සංරක්ෂිත වනයකට ගවයන්ට අයුතු ලෙස ඇතුළුවීමට ඉඩ දෙන හෝ තණකොළ හෝ වෙනයම් පැළෑටියක් කපන නැතහොත් එම තණකොළ හෝ පැළෑටි ගවයන්ට කෑමට ලබා දීම තහනම් ක්‍රියාවක් ලෙස සඳහන් කර තිබේ. එම පනතේ 7 (1) (ආ) වගන්තියට අනුව රක්ෂිත වනයකට ගවයින් ඇතුළු කිරීම සහ උක්ත සඳහන් කටයුතු තහනම් ක්‍රියා ලෙස සඳහන් කර ඇත. තවද, වනසංරක්ෂණ ආඥා පනතේ 20 (1) (ඉ) වගන්තිය යටතේ සංරක්ෂිත වනාන්තර හෝ රක්ෂිත වනාන්තර හෝ ගම්බද වනයක හෝ වෙනත් වනයක ගවයන්ට තෘණ කැවීමට තහනම් ක්‍රියාවක් ලෙස සඳහන් කර ඇත.

වනසංරක්ෂණ ආඥා පනතේ 8 වැනි පරිච්ඡේදයේ ගව අයාලය පිළිබඳව විශේෂයෙන් සඳහන්කර තිබේ. වනාන්තර තුළට අනවසරයෙන් ගවයන් ඇතුළු කිරීමට එරෙහිව ගත යුතු ක්‍රියාමාර්ග එහි සඳහන් කර ඇත. ඒ අනුව පැහැදිලි වන්නේ වන සංරක්ෂණ ආඥාපනත මගින් වනාන්තරවලට ගවයන් ඇතුළු කිරීම සහ තෘණ කැවීම පාලනය කිරීම සඳහා දැඩි නීතිමය ප්‍රතිපාදන සලසා තිබෙන බවය.

මෙරට තුළ එළ ගවයන් සහ මී ගවයන් මිලියන එකයි දශම හතරක් (1.4) ක් පමණ සිටී. මෙම ගවයන්ගෙන් මිලියනයකට වැඩි ප්‍රමාණයකින් ලැබෙන කිරි අස්වැන්න ඉතාමත් අඩුය. ඇතැම් එළ ගවයකුගෙන් දිනකට ලබා ගන්නා කිරි ප්‍රමාණය ලීටර් දෙකකටත් වඩා අඩුය. මෙරට තුළ කිරි නිෂ්පාදනය වැඩි කළ හැකි වන්නේ ගවයන් වනාන්තරවලට ඇතුළු කිරීමෙන් නොව උසස් තත්ත්වයේ කිරි දෙනුන් ඇති කිරීම මගිනි. මේ සඳහා තත්ත්වයෙන් උසස් තෘණ වර්ග වගා කළ යුතුය.

වනාන්තර තුළට ගවයන් ඇතුළු කළ පසුව තෘණ උලා කෑමේදී ස්වභාවිකව වර්ධනය වන පැළ වර්ග ගවයන්ට පෑගී ඒවා විනාශයට ලක්වන අතර, මෙම තත්ත්වය වනාන්තරවල ජෛව විවිධත්වයටද බලපෑම් එල්ල කරන්නේය. මෙම තත්ත්වය සමග වනාන්තර ඉඩම් මුඩුබිම් බවට පත්වන අතර, වසර 2030 වනවිටදී මෙරට වන ගහනය සියයට 30 ක් දක්වා වැඩිකර ගැනීමේ ඉලක්කයන් සපුරා ගැනීමටද නොහැකි වනු ඇත.

**ගවයන්ගෙන් මිලියනයකට වැඩි ප්‍රමාණයකින් ලැබෙන කිරි අස්වැන්න ඉතාමත් අඩුය. ඇතැම් එළ ගවයකුගෙන් දිනකට ලබා ගන්නා කිරි ප්‍රමාණය ලීටර් දෙකකටත් වඩා අඩුය. මෙරට තුළ කිරි නිෂ්පාදනය වැඩි කළ හැකි වන්නේ ගවයන් වනාන්තරවලට ඇතුළු කිරීමෙන් නොව උසස් තත්ත්වයේ කිරි දෙනුන් ඇති කිරීම මගිනි**

මෙලෙස ගවයන් විසින් ආක්‍රමණශීලී ශාක ආහාරයට නොගන්නා අතර, වනාන්තර තුළ තිබෙන සුවිශේෂී ශාක පමණක් ආහාරයට ගනී. මේ නිසා වනාන්තර තුළ ආක්‍රමණශීලී ශාක ව්‍යාප්තිය වැඩිවේ. ගවයන් විසින් තෘණ පමණක් නොව වනාන්තරවල තිබෙන ගස්වල ශාක පත්‍රද ආහාරයට ගැනීම නිසා අලියා, වඳුරා, ගෝනා, මුවා ආදී සතුන්ට ආහාර නොමැතිවීමේ තත්ත්වයක් උද්ගත වේ. මේ නිසා වනාන්තරවල සිටින සතුන් ආහාර සොයා ගම් වැදීමට පැමිණිය හැකිය. කෘෂි ඉඩම්වලට වනසතුන් හානි කිරීම නිසා වන සතුන් සහ මිනිසුන් අතර නිරතුරු ගැටුම් තත්ත්වයන් ඇතිවේ.

එමෙන්ම, වනසතුන් තුළ තිබෙන විවිධ ලෙඩ රෝග මිනිසුන්ට ඇතිවීමේ හැකියාවද වර්ධනය වේ. ගවයන් වනාන්තරවලට ඇතුළු කළ පසුව වන සතුන්ගේ ලෙඩ රෝග ගවයන්ට ඇතුළු වන අතර, ගවයාගෙන් එම රෝග මිනිසාටත්, ගවයන්ගේ ලෙඩ රෝග වනසතුන්ටත් ව්‍යාප්ත වේ.

වනාන්තර තුළ වෙසෙන සතුන්ගේ ප්‍රයෝජනය සඳහා වැව් සකස් කර තිබෙන අතර, ගවයන් වැව් පිටිවලට ගොස් තෘණ උලා කෑම සිදු කරයි. ගවයන් පිටකරන මල අපද්‍රව්‍ය වැසි ජලය සමග වැව් ජලයට එකතුවී වැව් ජලයේ නයිට්‍රජන් ප්‍රතිශතය ඉහළ යෑමෙන් ජලජ ශාක ව්‍යාප්තියද වර්ධනය වේ. වැව් තුළ ජලජ ශාක ව්‍යාප්තිය වැඩිවීම නිසා වන සතුන්ට වැව්වල ජලය පරිභෝජනය කිරීමට තිබෙන අවස්ථාවද අහිමිවී යයි.

කොටියා ආදී විලෝපික සතුන් වනාන්තර තුළදී ගවයන් ගොදුරු කර ගැනීමේ අවස්ථාවන්ද ඉහළ යයි. මෙම විලෝපිකයන් ගවයන් දිගින් දිගටම ආහාරයට ගැනීමට පුරුදුවීම නිසා ගවයන් සොයා විලෝපිකයන් ගම් වැදීමද වැඩිවේ.

මෙරට වනාන්තර තුළ තිබෙන ආකර්ෂණීය තත්ත්වය නිසා සංචාරකයන් විශාල වශයෙන් අභය භූමි කලාපවල සහ රක්ෂිත වනාන්තරවල සංචාරයේ නිරත වේ. නමුත්, වනාන්තර තුළ ගව ගහනය ඉහළ යෑමත් සමග මෙරට වනාන්තර පද්ධති සංචාරකයන්ගේ ආකාර්ෂණීයත්වයෙන් බැහැරවීමේ ඉඩ ප්‍රස්ථාව වැඩිය. එමෙන්ම, වනාන්තර තුළට ගවයන් ඇතුළු කිරීමේ මුවාවෙන් බොහෝ දෙනකු වනාන්තරවලට ඇතුළු වීමෙන් වන සතුන් දඩයම සහ වන අපරාධ සිදු කිරීම ඉහළ යයි. අපි මේ ගැන විෂයභාර ඇමැතිවරයාගෙන් සහ පරිසරවේදීන්ගේ ද අදහස් විමසුවෙමු.

## තෝරාගත් භූමි ප්‍රදේශ ගවයන් සඳහා නිදහස් කරන්න ලෑස්තියි

**වනජීවී හා වනසංරක්ෂණ ඇමැති**
**සී.බී. රත්නායක**

"රටේ කිරි අවශ්‍යතාව ඉහළ ගොස් තිබෙනවා. මේ නිසා අභය භූමි කලාපවල තෝරාගත් භූමි ප්‍රදේශ ගවයන් සඳහා නිදහස් කරන්න ලෑස්තියි. සෝමාවතිය ජාතික වනෝද්‍යානයට ඇතුළු කෙරෙන්නේ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ගවයන්ම නොවෙයිනේ. හම්බන්තොට ආදී ප්‍රදේශවල අයාලේ දන හරක් පවා සෝමාවතියට එනවා. මෙහිදී සෝමාවතිය පමණක් නොව තවත් තැන්වල කොටුවක් ගහලා වෙන් කරලා ගවයන්ට දෙනවා. මෙහිදී ගවයන්ට අභයභූමි කලාපයේ අභ්‍යන්තරයට යන්න දෙන්නේ නෑ. මොකද අභ්‍යන්තරයට යන්න දුන්නොත් ලොකු විනාශයක් සිදුවෙනවා. මෙය තවමත් යෝජනාවක් පමණයි."

## නිදැල්ලේ ඉන්න ගවයන්ට තණකොළ කන්න දෙනවා කියන්නේ නොදියුණු සංකල්පයක්

**පාරිසරික නීතිඥ**
**ආචාර්ය ජගත් ගුණවර්ධන**

"කිරි නිෂ්පාදනය ඉහළ දැමීමට යැයි පවසා අභයභූමි කලාපවලට හරක් දැමීම ගර්හිත සංකල්පයක් ලෙස හඳුන්වා දෙන්න පුළුවන්. හරකුන්ගේ කිරි නිෂ්පාදනය ඉහළ දැමීමට නම් කාරණා කීපයක් ඉෂ්ට විය යුතුයි. පළමුවැන්න තමයි හොඳ මට්ටමේ කිරි ගවයන් සිටිය යුතුයි. එනම් වැඩි කිරි නිෂ්පාදන ධාරිතාවක් සහිත සතුන් සිටිය යුතුයි. දෙවැන්න එම සතුන්ට සුදුසු පෝෂණ තත්ත්වය ලබාදිය යුතුයි. හොඳ වත්පිළිවෙත් තිබිය යුතුයි. නිදැල්ලේ සිටින ගවයන්ට තණකොළ කන්න දෙනවා කියන්නේ නොදියුණු සංකල්පයක්. හරියට කරනවා නම් රජයේ ඉඩම්වල වටිනා ගුණාත්මක තත්ත්වයෙන් වැඩි තණකොළ වවන්න කටයුතු කිරීමයි වැදගත් වෙන්නේ. එහෙම නැතිව මේ ස්වාභාවිකව තියෙන තණකොළ භූමිවල තියෙන ගුණාත්මක තත්ත්වයෙන් අඩු තණකොළ කෑමට සැලැස්වීම නොවෙයි.

මේ සංකල්පයම වැරදියි. කිරි නිෂ්පාදනය වැඩි කරන්න ගවයන් ටික කොහේ හරි තණකොළ තියෙන තැනකට ගිහින් දනවා කියන එකම හරිම නොදියුණු වසර සියයකටත් වඩා එහා පැත්තේ අතහැරදාපු සංකල්පයක්. දැන් කිරි නිෂ්පාදනය වැඩි කිරීමට නම් කළ යුත්තේ රජයේ ඉඩම් තෝරාගෙන, ඒවායෙහි ගවයන්ට සුදුසු තණකොළ සිටුවා, නිසි පරිදි අස්වැන්න නෙළා ගන්නා ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. ඒ වගේම වැඩි කිරි ප්‍රමාණයක් නිෂ්පාදනය කළ හැකි ගවයන් ඇති කළ යුතුයි.

අභයභූමි ජාතික උද්‍යාන තුළ තණකොළ ආහාරයට ගන්නා සතුන් ඉන්නවා. මේ කැලෑවලට හරක් දැමූ පසුව කැලෑවල ඉන්න සත්තු මොනවාද ආහාරයට ගන්නේ. අභයභූමි, ජාතික උද්‍යාන භාරව ඉන්න ඇමැතිවරයා මුලින්ම හිතන්න ඕනේ ඒ පිළිබඳවයි. වනජීවී ඉන්න භූමියට හරකුන් දපුවාම එහි ධාරිතාව වැඩිවෙනවා. මේ නිසා වනජීවීන්ට කන්න දේවල් නැතිවෙනවා.

පහතරට තෙත් කලාපයේ වනාන්තරවල කොටි ඉන්නවා. කොටි ඇවිත් අනිවාර්යයෙන්ම ගවයන් ආහාරයට ගන්නවා. ලංකාවේ කොටි ගහනය 1000 ක්වත් නෑ. ඉන්න කොටි ටිකත් මැරෙන එකයි වෙන්නේ. සංචාරකයන් එන්නේ වනජීවීන් බලන්න මිසක් හරක් බලන්න නොවෙයි. සත්ත්ව නිෂ්පාදනය පැත්තෙන් ගත්තත්, සංචාරක ක්ෂේත්‍රය පැත්තෙන් ගත්තත් මේවා අමනෝඥ තීරණ. මේ තීරණය හොඳයි කියලා කියන්න පුළුවන් කිසිම පැත්තක් නෑ."

**වනාන්තර තුළට ගවයන් ඇතුළු කළ පසුව තෘණ උලා කෑමේදී ස්වභාවිකව වර්ධනය වන පැළ වර්ග ගවයන්ට පෑගී ඒවා විනාශයට ලක්වන අතර, මෙම තත්ත්වය වනාන්තරවල ජෛව විවිධත්වයටද බලපෑම් එල්ල කරන්නේය. මෙම තත්ත්වය සමග වනාන්තර ඉඩම් මුඩුබිම් බවට පත්වන අතර, වසර 2030 වනවිටදී මෙරට වන ගහනය සියයට 30 ක් දක්වා වැඩිකර ගැනීමේ ඉලක්කයන් සපුරා ගැනීමටද නොහැකි වනු ඇත**

## වනජීවි කලාප තුළට ගවයන් ඇතුළු කිරීම තහනම්

**පරිසර යුක්ති කේන්ද්‍රයේ**
**ජ්‍යෙෂ්ඨ උපදේශක**
**හේමන්ත විතානගේ**

"වනසත්ව හා වෘක්ෂලතා ආඥා පනතට අනුව වන සංරක්ෂණ හා වනජීවී කලාප තුළට ගවයන් ඇතුළු කිරීම තහනම්. මේ රටේ වනාන්තර ගැන කොහොම කතා කළත් ඉතිරි වෙලා තියෙන්සිනේ යයට 28 ක ප්‍රතිශතයක් විතරයි. මේ වනාන්තර තුළට ගවයන් ඇතුළු කිරීම මගින් සිදු වන්නේ වනසතුන්ට කන්න තියෙන ආහාර ටිකත් අහිමිවී යෑමයි. හරක් 10 ක් 15 ක් විතර එකතු වෙලා එක අලියකුගේ තෘණ ටික කනවා. හරක් මිලියන ගාණක් කැලෑවට දපුවාම අලින්ට ආහාරයට ගන්න දෙයක් ඉතිරි වෙන්නේ නෑ. ඒ වගේම වන සතුන්ට ලෙඩ රෝග ව්‍යාප්ත වීමේ හැකියාවත් තිබෙනවා.

ලංකාවේ ගවයන් හදන්නේ කිරි ගන්නම විතරක් නොවෙයි. ගොඩක් හරක් පට්ටිවල ගවයන්ගෙන් දිනකට ලබා ගන්නේ කිරි ලීටර් 40ත් 50ත් අතර ප්‍රමාණයක්. හරක් පට්ටිවල අය කරන්නේ මේ සත්තු කැලේට දලා කන්න දීලා මසට විකුණන එකයි. නිල්ගල වනාන්තර කලාපයේ මේ කටයුත්ත මහා පරිමාණයෙන් සිදු කෙරෙනවා. ගවයන් හදනවා නම් ඇති කළ යුත්තේ මිනිසාට ප්‍රයෝජනයක් ලබාගත හැකි පරිදියි. කැලෑවල ඉන්න හරකුන්ගෙන් ආර්ථිකයට දයකත්වයක් ලැබෙන්නේ නෑ. මේ ගව පට්ටි අයිතිකාරයෝ බොහෝ දෙනෙක් ඉන්නේ පාර්ලිමේන්තුවේ. මේ අයගේ අවශ්‍යතා මතයි මේ සැලසුම් සකස් කෙරෙන්නේ. දේශීය කිරි කර්මාන්තය ඉහළ නැංවීමට නම් තත්ත්වයෙන් උසස් ගවයන් ඇති කළ යුතුයි. නැතුව හරක් කැලෑවට දලා කිරි කර්මාන්තය නංවන්න බෑ."

## ගවයන් රක්ෂිත තුළට ඒමෙන් ජෛව විවිධත්වය බිඳවැටෙනවා

**ලක් සොබා සංරක්ෂකයෝ සංවිධානයේ සභාපති,**
**නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ**
**සමන්ත ගුණසේකර**

"වනාන්තරවලට ගවයන් ඇතුළු කිරීමට ඉඩ දීම ලොකු ප්‍රශ්නයක්. අභය භූමියක් හරි රක්ෂිතයක් හරි පිහිටුවලා තියෙන්නේ වනජීවීන් සඳහායි. මේ කලාපවලට ගවයන් යෙදූ පසුව ජෛව විවිධත්වය බිඳ වැටෙනවා. අලින්ට තිබෙන තෘණ ටික ගවයන් ආහාරයට ගත් පසුව අලි ගම් වදිනවා. මේ නිසා අලි මිනිස් ගැටුම වැඩිවෙනවා. සංචාරක කර්මාන්තයටත් මේ තත්ත්වය බලපානවා. මේ අය අභයභූමි කලාපවලට යන්නේ හරක් බලන්න නොවෙයි. අපේ අභයභූමි කලාපවල හරක් ඉන්නේ කියලා අන්තර්ජාතික වශයෙන් ප්‍රචාරය වුණාම එය මෙරට සංචාරක කර්මාන්තයට දැඩි බලපෑමක් එල්ල වෙනවා.

රක්ෂිත කළමනාකරණය කෙරෙන්නේ විදෙස් ආධාර මතයි. ලෝක නීතිවලට පිටුපෑම නිසා අන්තර්ජාතික වශයෙන්ද අප්‍රසාදයට ලක්වෙනවා. රජයකට සැලසුමක් තිබිය යුතුයි. අලි-මිනිස් ගැටුම, කැලෑවලට ගවයන් දැමීම, අනවසරයෙන් ඉඩම් ඇල්ලීම, පුරාවස්තු ජාවාරම යන කටයුතුවලට මූලික හේතුව තමයි නිවැරදි ඉඩම් කළමනාකරණයක් නොමැතිවීම.

රටක ගවයන් හදනවා නම් නිසි තාක්ෂණය යොදා ගත යුතුයි. ඔස්ට්‍රේලියාවේ ගවයන්ගෙන් වැඩි කිරි නිෂ්පාදනයක් ගන්නේ ගවයන් කැලෑවලට දලා නොවෙයිනේ. අපේ ගවයන්ට සුදුසු තෘණ වර්ග වගා කළ යුතුයි. කැලෑවලට ගවයන් දන මුවාවෙන් වන අපරාධ ඉහළ යන්නත් පුළුවන්."



■ සාලිය කුමාර ගුණසේකර